*සැ. යු.-* 2018.02.16 දින පළ වූ අංක 2059 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,060 - 2018 පෙබරවාරි මස 23 වැනි සිකුරාදා - 2018.02.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 332 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 341 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 මාර්තු මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

01. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වැටුප් පරිමාණය* :

අංක 03/2016 හා 2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව වැටුප් පරිමාණය SL 1-2016 වේ. එනම් රු. 47,615-10x1335-8x1630-17x2170-රු.110,895/- වේ. ආරම්භක වැටුප් පියවර මෙම වැටුප් පරිමාණයෙහි 03 වන පියවර (රු. 50,285/-) වේ. රු. 58,295/- ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. වයස අවුරුදු 45 සම්පූර්ණ කරන ලද නියමිත වැටුප් පියවරට එළඹී අයදුම්කරුවන් කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ. (2020.01.01 දක්වා රා.ප.ච. 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.)

03. *වයස් සීමාව* :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

(*අ*) අවුරුදු 04කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියෙහි යෙදී සිටි නීතිඥවරයෙකු වීම

*හෝ*

(*ආ*) ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ නිලධරයෙකු වීම

*හෝ*

(*ඇ*) රජයේ නෛතික අංශවල යටත් පිරිසෙයින් අවුරුදු 07ක සේවා පළපුරුද්දක් සහ සාමාන්‍ය ලිපිකාර සේවයේ පළමුවන පන්තියේ/රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ අවුරුදු 05ක සේවා කාලයක් හිමි නිලධරයෙකු වීම හෝ රජයේ නෛතික අංශවල යටත් පිරිසෙයින් අවුරුදු 12ක සේවා පළපුරුද්දක් සහ සාමාන්‍ය ලිපිකාර සේවයේ II පන්තියේ 'අ' ඛණ්ඩයේ / රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ අවුරුදු 10ක සේවා කාලයක් හිමි නිලධරයෙකු වීම.

*සටහන* - අධිකරණයන්හි ක්‍රියාපටිපාටිය, ගිණුම් කටයුතු, පරිපාලන කටයුතු හා විගණන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

05. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. සෑම අයදුම්කරුවෙක්ම,

(*අ*) විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(*ආ*) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

07. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට නිලධාරීන් යටත් විය යුතු ය.

08. පහත සඳහන් ලිපි ලේඛන ඉල්ලා සිටිවිට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකි විය යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය
(*ආ*) උසස්ම අධ්‍යාපන සහතිකය
(*ඇ*) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය
(*ඈ*) සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත් වී ඇති උසස්ම විභාග පිළිබඳ සහතික හා
(*ඉ*) අධිකරණ ක්‍රියාපටිපාටිය, ගිණුම් කටයුතු, විගණන කටයුතු, පරිපාලන කටයුතු හා විමර්ශන සහ විනය කටයුතු පිළිබඳ පළපුරුද්ද සනාථ කෙරෙන සහතික (ඇත්නම් පමණි)

09. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම් පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය.

10. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2018.03.15 වැනි දින හෝ ඊට පෙර "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, අළුත්කඩේ, කොළඹ 12" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දිය හැකි ය.

11. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

12. රජයේ/සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය.

13. අයදුම්පත් හා ඊට අදාළ වෙනත් ලිපි ගණුදෙනු පිළිබඳව ඇමතිය යුත්තේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මිස, මෙම කාර්යාලයේ වෙනත් කිසිම නිලධාරියෙකු නොවේ.

14. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළකරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

සංජීව සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2018 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

***සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා ආදර්ශ අයදුම්පත***

01. (i) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) ස්ථිර ලිපිනය :————.
(ii) කාර්යාලයීය ලිපිනය :————.

03. ජාතිය :————.

04. (i) උපන් දිනය :————.
(ii) වයස :————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(ii) විවාහක ද? අවිවාහක ද? වැන්දඹු ද? :————.
(iii) ස්වාමි පුරුෂයා/භාර්යාව, රජයේ/සංස්ථා හෝ පෞද්ගලික ආයතනයක සේවයේ නියුක්ත නම් ඒ පිළිබඳ විස්තර :————.

06. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :————.
(දින සඳහන් කරමින්)

07. ගැසට් නිවේදනයේ 04 වන ඡේදයේ (අ), (ආ) හා (ඇ) හා එහි සටහන යටතේ අදාළ විස්තර සම්පූර්ණයෙන් :————.
(දින/කාල පරිච්ඡේද සඳහන් කරමින්)

08. (i) නීතිඥවරයෙකු නම් වෘත්තියට ඇතුළත් වූ දිනය :————.
(ii) ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය :————.
(දින/කාල පරිච්ඡේද සඳහන් කරමින්)

09. රජයේ/සංස්ථාවක සේවයේ යෙදී සිටී නම් සම්පූර්ණ සේවා විස්තර :————.
(දින/කාල පරිච්ඡේද සඳහන් කරමින්)

10. සමත් වී ඇති උසස්ම විභාගය
(i) සිංහලෙන් :————.
(ii) දෙමළෙන් :————.
(iii) ඉංග්‍රීසියෙන් :————.

11. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය ෑ
(ඒ අය ඔබ හොඳින් දන්නා වගකිවයුතු පුද්ගලයන් විය යුතුය)
(රජයේ/සංස්ථා සේවයේ යෙදී සිටින අයට මෙය අදාළ නොවේ)

(i) නම :————.
ලිපිනය :————.
රක්ෂාව :————.
ඔබව දැන සිටින කාල පරිච්ඡේදය :————.

(ii) නම :————.
ලිපිනය :————.
රක්ෂාව :————.
ඔබව දැන සිටින කාල පරිච්ඡේදය :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියාගේ සහතිකය

.................................................................................................... නමැති නිලධාරියා/නිලධාරිනිය විසින් මෙහි 09 වන ඡේදයේ දක්වා ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදිය. උක්ත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මුදාහැරිය හැක/නොහැක.

————,
දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

02-609

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

නීති නිලධාරි (විධායක නිලධාරි ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා
විවෘත පදනම මත බඳවා ගැනීම - 2018
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරේ පවතින එක් පුරප්පාඩුවක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

I අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :—
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

II පළපුරුද්ද :—
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥයෙකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තිය පළපුරුද්දක් ලබා තිබීම.

III කායික සුදුසුකම් :—
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV වෙනත් සුදුසුකම් :—

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(II) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුලත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(III) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර පහක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(IV) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි විධායක නිලධර ගණයේ (නීති නිලධාරි තනතුරට) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධානයන්ට හා ඊට මතුවට කරනු ලබන්නා වූ සංශෝධන සහ විධිවිධානයන්ට යටත් වේ.

04. *වයස් සීමාව :*

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු. 47,615-10x1335-8x1630-17x2170-රු. 110,895/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක SL - 1 - 2016 වැටුප් කාණ්ඩය වේ. මෙම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

06. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :*

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | 20 |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | **සටහන :** ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතුයි.<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම් වලින් එකක් සඳහා පමණක්) | | |
| 02. | **අතිරේක වෘත්තීය සුදුසුකම්** | | 15 |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ පාශ්චාත් උපාධි නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03. | **අතිරේක පළපුරුද්ද**<br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30 ක්<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03ක සෙවා කාලය හැර)<br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ විනිසුරුවරයෙකුගෙන් හෝ ලබාගත් අදාළ කාලසීමාව හෝ කාලසීමාවන් නිශ්චිතව සඳහන් වන සහතිකයක්/සහතික පත් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | 30 |
| 04. | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව** | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.) | 15 | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් සඳහා (වසර 01 හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා/ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් සඳහා | | |
| | - මාස 06/ පැය 720 | 07 | |
| | - මාස 03/ පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ.) | | |
| 05. | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම** | | 15 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා | 15 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු (පැය 1500ක් සඳහා) තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් සඳහා | | |
| | - මාස 06/ පැය 720 | 07 | |
| | - මාස 03/ පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.) | | |
| 06. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව** | | 05 |
| | **මුළු එකතුව** | | 100 |

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. *අයදුම්පත ඉදිරිපත් කිරීම :*

(I) අයදුම්පත් 2018.03.26 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
අංක 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

(II) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.1 සිට 5.1 දක්වාත් දෙවැනි පිටුව 5.2 සිට 7 දක්වාත්, තෙවැනි පිටුව 8 සිට 9 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(III) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "පළත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(IV) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු. 32,807/- ක හෝ ඊට වැඩි මූලික මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(V) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(VI) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. **පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.**

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එච්.ටී. කමල් පත්මසිරි,
ලේකම්,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2018 පෙබරවාරි මස 09 වැනි දින
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
කොළඹ 02.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම***

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

1.1 මුලකුරු සමග නම :- Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්)

2.1 ස්ථිර ලිපිනය :————.

2.2 දුරකථන අංකය :
ස්ථාවර :————. ජංගම :————.

3.1 ජන වර්ගය : ☐

(සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 4, වෙනත් - 5)

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

3.3 විවාහක/අවිවාහක බව :

| | | | |
|---|---|---|---|
| විවාහක | | අවිවාහක | |

3.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.5 උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

3.6 2018.03.26 දිනට වයස අවුරුදු :————. මාස :————. දින :————.

4.1 නීතිය පිළිබඳ ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර :
(අ) (i) විශ්වවිද්‍යාලය :————.
(ii) උපාධිය පිරිනැමූ දිනය :————.
(ආ) (ii) නීති විද්‍යාලයීය ලි.ප. අංකය :————.
(ii) නීති විභාගය සමත් වූ දිනය :————.

5.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

5.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට ලබා ඇති සාමාර්ථය :————.

5.3 නීතිඥයෙකු ලෙස සක්‍රීය පළපුරුද්ද (වසර ගණන) :————.
(කාලසීමාව හා කා යටතේ පළපුරුද්ද ලබා ගත්තේ ද යන්න සඳහන් කරන්න)

5.4 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 ඡේදය අනුව සුදුසුකම් :

| අනු. අංකය | සුදුසුකම් | ආයතනය | කාලසීමාව |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| 02 | අතිරේක වෘත්තීය සුදුසුකම් | | |
| 03 | අතිරේක සුදුසුකම් | | |
| 04 | ඉංග්‍රීසි | | |
| 05 | තොරතුරු තාක්ෂණය | | |

6. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
ඔව්/නැත

6.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

7. *අයදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත් කර ගැනීමෙන් පසුව එම වරද දැන ගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 32,807/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................................................................................................................ (සම්පූර්ණ නම) මහතා / මහත්මිය / මෙනවිය/ මා පෞද්ගලිකව හඳුනන බවත්...................................................... දින මා ඉදිරිපිට දී ඉහත 07 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
(සහතික කරන්නාගේ අත්සන).

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————. දුරකතන අංකය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

9. *ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................................................................ (සම්පූර්ණ නම) මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ............................ දින මා ඉදිරිපිටදී ඉහත 07 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.
ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම ...................................................... බවත් මම සහතික කරමි.
දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකිය.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන).

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

02-853

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2018

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණියේ එක් තනතුරක් සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් පහත උපදෙස් අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආහාර කොමසාරිස්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ "වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2018 මාර්තු මස 09 වැනි දින වේ.

*සටහන* : ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරු විසින් ම විඳදරාගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් එක් අයෙකු, වැඩ **පරීක්ෂක** III වන **ශ්‍රේණිය** තනතුර සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර (03) ක පරිවාස කාලයකට යටත් වන අතර එම වසර (03) අතුළත පළමුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව වසර 05ක් තුළදී 11 ඛණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම ලබා ගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN 3- 2016 යටතේ 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750 - 57,550ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ.

4. i. *අධ්‍යාපන සුදුසුකම් :*

1. භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව විෂයන් සඳහා සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වී තිබීම.

*හා*

2. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

4. ii. *වෘත්තීය සුදුසුකම්*

1. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

4. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය ;

6. *කායික සුදුසුකම් :*

සෑම අයදුම්කරුවෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *ලිඛිත විභාගය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය පැය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| 1. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 | 100 | 40% | ගොඩනැගිලි ඉදිකිරීම, සැලසුම් සකස් කිරීම, නඩත්තු (වායු සමීකරණ, ජලනල, විදුලිය) පිඹුරුපත් කියවීම, වැඩ බිමක සේවක කළමනාකරණය පිළිබඳ මූලික සංකල්ප |
| 2. බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% | සාමාන්‍ය දැනීම |

8 i. **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :** ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වේ.

9. *විභාග කොන්දේසි :*

i. විධිමත් ලෙස අයදුම්පත් ඒවා ඇති අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු/ අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිඳු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ;

ii. මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ;

iii. තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කල යුතු ය. මේ සඳහා

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ;

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

iv. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ;

v. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට ආහාර කොමසාරිස් විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ;

vi. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ;

vii. මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීමේ අංශය විසින් කොළඹ විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ.

10. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

i. ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 (සෙ.මී. 24X29) ප්‍රමාණයේ කඩදසි භාවිත කරමින්, අංක 01 සිට 04 තෙක් ඡේද පළමු පිටුවට ද, අංක 05 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුවලටද ඇතුළත්වන සේ සකස් කර තම අත් අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කළ යුතු ය;

ii. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවලට දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද, සඳහන් කළ යුතු ය;

iii. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ;

iv. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය;

v. විභාග ගාස්තුව රු. 750.00 කි. එම විභාග ගාස්තුව, ආහාර කොමසාරිස් නමින් ලංකා බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ ගිණුම් අංක 7042667 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ රිසිට්පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ;

vi. සෑම අයදුම්කරුවෙකුම තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 240,360.00 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය;

vii. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය;

viii. අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය ලබාදීම ආහාර කොමසාරිස් සතුවේ. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ජේ. ක්‍රිෂ්ණමූර්ති,
ආහාර කොමසාරිස්,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව.

2018 ක් වූ පෙබරවාරි මස 23 වැනි දින,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව.
අංක 330,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ වැඩ පරීක්ෂක තනතුරෙහි III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018*

*Open Competitive Examination for the Recruitment of Supervisory Management Assistant (Technical Service Category) Inspector of Works Grade III of Food Commissioner's Department - 2018*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

1.0

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA HERATH)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.0

2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 දුරකතන අංකය :————.

4.0 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය
පුරුෂ - 0 ☐ (අදාළ අංකය කොටුව තුළ
ස්ත්‍රී - 1 ලියන්න)

5.0 5.1 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

5.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

6.0 අධ්‍යාපන සුදුසුකම් :

6.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය :————.

II. විභාග අංකය :————.

III. ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

6.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාගයේ වර්ෂය හා මාසය :————.

II. විභාග අංකය :————.

III. ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 3 | |
| 2 | | 4 | |

6.3 පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම් :

I. විශ්ව විද්‍යාලය :————.

II. උපාධිය :————.

III. විභාග අංකය :————.

7.0 *වෘත්තීය සුදුසුකම්* :

I. ————————————————.

II. ————————————————.

8.0 පළපුරුද්ද :————.

9.0 ඔබ කවදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) :————.

10.0 විභාග ගාස්තු ගෙවූ රිසිට්පත පිළිබඳ විස්තර:

I. විභාග ගාස්තුව ගෙවන ලද ලංකා බැංකු ශාඛාව :————.

II. ගෙවූ මුදල රු. :————.

| විභාග ගාස්තු ගෙවූ රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(රිසිට්පතේ ඡායා පිටපත් ළග තබා ගන්න) |
|---|

11.0 *අයදුම්කරුගේ සහතිකය* :

(*අ*) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

(*ඇ*) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(*ඈ*) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................ මහතා/මහත්මිය/මෙනවිය/මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම රිසිට්පත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී ..................................... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

13.0 *රාජ්‍ය සේවකයෙකු නම් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ................................... මයා/මිය/මෙය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ/ ආයතනයේ ස්ථිර/ අනියම්/ තාවකාලික නිලධාරියකු/ නිලධාරිනියක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
හෝ බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිලමුද්‍රාව තබා සහතික කළ යුතු ය.)

02-736

---

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ - 2017 (2018)

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් හා දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ 2018 ජූනි මස කොළඹ දී සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයන් හි දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. වාචික පරීක්ෂණය කොළඹ දී පමණක් පැවැත් වේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකට ම එකවර ඉදිරිපත් වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශය :*

1 වන හා 2 වන කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවෙහි අන්තර්ගත වී ඇත.

දෙවන භාෂා පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන මීට අමුණා ඇති පරිශිෂ්ටය 'අ' හි ද, 1 වන සහ 2 වන කාර්යක්ෂමතා කඩඉම්වලට හා විදේශ භාෂාවලට අදාළ විෂය නිර්දේශ හා විධිවිධාන පරිශිෂ්ටය 'ආ' හි ද දක්වා ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී, ඔවුන්ගේ කැමැත්ත අනුව පෙනී සිටීමට නිලධාරීන්ට අවසර තිබේ. දෙවන භාෂා පරීක්ෂණයට පෙනී සිටින නිලධාරීන් සඳහා වූ වාචික පරීක්ෂණය එකම ස්ථානයක දී එකම වේලාවේ දී පැවැත්වීමට කටයුතු කරනු ඇත.

04. කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

**1 වන කාර්යක්ෂමතා කඩඉම**

| *විෂය අංකය* | *විෂයය* | *කාලය පැය* |
|---|---|---|
| I වන කොටස | | |
| 01 | මුදල් | 03 |
| 02 | ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය | 03 |
| II කොටස | | |
| 03 | මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 04 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 05 | ජාත්‍යන්තර කටයුතු | 03 |
| 06 | ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි හා පරිගණක හැකියාව | 03 |

**2 වන කාර්යක්ෂමතා කඩඉම**

| විෂයය අංකය | විෂයය | කාලය පැය |
|---|---|---|
| I වන කොටස | | |
| 21 | ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය | 03 |
| 22 | පරිපාලනය<br>(අ) කාර්යාල ක්‍රම හා සංවිධාන ක්‍රම<br>(ආ) ආයතන සංග්‍රහය<br>(I සහ II වෙළුම) | 03 |
| II කොටස | | |
| 23 | මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 24 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 25 | ජාත්‍යන්තර කටයුතු | 03 |

විදේශ භාෂා

| විෂයය අංකය | විෂයය | කාලය පැය |
|---|---|---|
| 07 | අරාබි | 02 |
| 08 | ප්‍රංශ | 02 |
| 09 | රුසියානු | 02 |
| 10 | ස්පාඤ්ඤ | 02 |
| 11 | හින්දි | 02 |
| 12 | චීන | 02 |
| 13 | ජර්මන් | 02 |
| 14 | ජපන් | 02 |
| 15 | ඉතාලි | 02 |
| 16 | කොරියානු | 02 |

දෙවන භාෂා

| විෂයය අංකය | විෂයය | කාලය පැය |
|---|---|---|
| 30 | සිංහල (ලිඛිත) | 02 |
| 31 | දෙමළ (ලිඛිත) | 02 |
| 32 | ඉංග්‍රීසි (ලිඛිත) | 02 |
| 33 | සිංහල (වාචික) | |
| 34 | දෙමළ (වාචික) | |
| 35 | ඉංග්‍රීසි (වාචික) | |

05. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි යොමු කරවනු ලැබේ.

"දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළු) -

උසස් කිරීමේ විභාගවලට මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට ද මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළත්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවය. තරග විභාගයක් නොමැතිව මුලින් ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය."

05.1 ප්‍රතිඵල නිකුත් කිරීම :

විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනය, 1වන කාර්යක්ෂමතා කඩඉම හා 2වන කාර්යක්ෂමතා කඩඉම ලෙස වෙන් වෙන් වශයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත පමණක් ලබාදෙනු ඇත.

06. විදේශ භාෂා හැර අනෙකුත් ප්‍රශ්න පත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂකයින්ට හැකි වනු පිණිස විභාග කොමසාරිස් ජනරාල් කටයුතු කරනු ඇත. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අපේක්ෂකයෙක් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව, ඒ 4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ඒ 4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර, අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 8 දක්වා පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත්වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් යෙදිය යුතුය. විභාග දෙකටම පෙනී සිටින අයදුම්කරුවන් ඒ ඒ විභාගය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම් පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න.

08.1 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. සියලුම අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් 2018 මාර්තු මස 23 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්ට යැවීමට හැකිවන පරිදි, විදේශ කටයුතු අමාත්‍යාංශයේ, විදේශ දූත මණ්ඩල පාලන අංශයට එවිය යුතුය. විදේශ දූත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් දූතමණ්ඩල ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

11. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර යොමු කරන ලද සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම්, තම ඉල්ලුම් පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද සහිතව ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කොට අදාළ ඉල්ලීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කිරීම වඩාත් ඵලදායී වනු ඇත. (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙහි ෆැක්ස් අංක -0112784232)

11.1 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11.2 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

13. විභාග මධ්‍යස්ථානයේ දී අනන්‍යතාව සනාථ කරනු සඳහා පිළිගනු ලබන අනන්‍යතා පත්‍ර මෙසේය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. පළමුවන වතාවට මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාග ගාස්තුවලින් නිදහස් වන අතර, ඉන්පසුව පෙනී සිටින අවස්ථාවල දී පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුය.

(*අ*) පළමුවන වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක්) සඳහා ගාස්තු අය නොකෙරේ.

(*ආ*) ඉන්පසු එක් එක් වතාව සඳහා

| | *රු. ශත* |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 1200.00 |
| එක් විෂයයකට | 600.00 |
| වාචික පරීක්ෂණයට | 300.00 |

විභාග ගාස්තු, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට විදේශ දූත මණ්ඩලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවීමට කටයුතු කරන්න. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිදු හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

15.මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. විභාගය සම්බන්ධ අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

16.සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලත්වයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ප්‍රසාද් කාරියවසම්,
විදේශ කටයුතු ලේකම්.

2018 පෙබරවාරි මස 09 වැනි දින,
විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ-01.

ආදර්ශ අයදුම්පත

විදේශ කටයුතු අමාත්‍යාංශය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ 1වැනි හා 2වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳව පරීක්ෂණය - 2017 (2018)**

1st and 2nd Efficiency Bar Examination and Second Language Test for the Officers of the Sri Lanka Foreign Service - 2017/2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4

(කොටුව තුළ අදාළ අංකය සඳහන් කරන්න)

01. ඉල්ලුම් කරන විභාගය
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

| විභාගය | අදළ අංකය |
|---|---|
| කාර්යක්ෂමතා කඩඉම 1 | 1 |
| කාර්යක්ෂමතා කඩඉම 2 | 2 |
| දෙවන භාෂාව | 3 |
| විදේශ භාෂාව | 4 |

02. (අ) (i) සම්පූර්ණ නම :
(සිංහලෙන්/දෙමළෙන්) :————.
(ii) මුල'කුරු සමග අගට යෙදෙන නම :
(සිංහලෙන්/දෙමළෙන්) :————.
(iii) මුල'කුරු සමග අගට යෙදෙන නම,(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(අගට යෙදෙන නමට පසුව මුල් අකුරු සඳහන් කරන්න)
*උදා* : (SILVA A.B.)
(ආ) (i) මුල'කුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ii) මුල'කුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

05. ජාතික හැඳුනුම් පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

07. ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වූ දිනය:

වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

08. වර්තමාන තනතුර :————.

09. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති අන්දමට ඉල්ලුම් කරන විභාගයට අදාළ විෂයය අංක පැහැදිලිව සඳහන් කළ යුතුය. (අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විෂයන් හැර වෙනත් විෂයන්වලට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.)

| විෂයය | විෂය අංකය |
|---|---|
| i. | |
| ii. | |
| iii. | |
| iv. | |
| v. | |
| vi. | |

10. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විභාග අංකය, විෂයය, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

විභාග ගාස්තු ගෙවන ලද අංක .................... දරන කුවිතාන්සිය මෙයට අමුණා ඇත.
ගෙවන ලද විභාග ගාස්තුව රු.......................................

————, ————,
දිනය අපේක්ෂකයාගේ අත්සන.

විභාග ගාස්තු :
(i) ගෙවන ලද තැපැල් / උප තැපැල් කාර්යාලය / විදේශ දූත මණ්ඩලය
(ii) ගෙවූ මුදල
(iii) ගෙවූ දිනය
(iv) ලදුපත් අංකය

| මුදල් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ............................................ මයා/ මිය/මෙනෙවිය, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සනත්, අයදුම්කරු නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුරඃ..............

දිනයඃ..........................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

පරිශිෂ්ටය "අ "

**සිංහල**
සිංහල පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස්වලින් සමන්විත වේ.
ලිඛිත පරීක්ෂණය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ.

(i) ව්‍යාකරණ
(ii) සිංහලෙන් ලියන ලද පෙත්සම් හෝ ග්‍රාම සේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරළීම
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් ගත් කොටසක් සිංහලයට පෙරළීම

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ.
(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු, සිංහල අයකු විසින් වටහාගෙන ලියාගත හැකිවන පරිදි සිංහලෙන් කියවීම.
(ii) සිංහල භාෂාවෙන් ලියන ලද පෙත්සමක් කියවීම.
(iii) කථාව හා භාෂණ පරිවර්තනය.

මෙම පරීක්ෂණයේ අදහස වනුයේ විවිධ සමාජ කණ්ඩායම්වල කථන සිංහල තේරුම් ගැනීමට ද, සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතුවල දී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

**දෙමළ**
දෙමළ පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස්වලින් සමන්විත වේ.
ලිඛිත පරීක්ෂණය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ.
(i) ව්‍යාකරණ
(ii) දෙමළ භාෂාවෙන් ලියන ලද පෙත්සම් හෝ ග්‍රාම සේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරළීම
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් ගත් කොටසක් දෙමළ භාෂාවට පෙරළීම

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ.
(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු දෙමළ අයකු විසින් වටහාගෙන ලියාගත හැකිවන පරිදි දෙමළෙන් කියවීම.
(ii) දෙමළ භාෂාවෙන් ලියන ලද පෙත්සමක් කියවීම
(iii) කථාව හා භාෂණ පරිවර්තනය

මෙම පරීක්ෂණයේ අදහස වනුයේ විවිධ සමාජ කණ්ඩායම්වල කථන දෙමළ තේරුම් ගැනීමට ද, සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතුවල දී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද, අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

**ඉංග්‍රීසි**
ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, සමත්වීම සඳහා අපේක්ෂකයින් විසින් 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ.
(i) ව්‍යාකරණ
(ii) අවබෝධය
(iii) සාරාංශ ලිවීම
(iv) වාර්තා හා ලිපි ලිවීම
(v) වාග් මාලාව

ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් අපේක්ෂකයින්ගේ දැනගැනීම සඳහා පහත දක්වා ඇත.

**Part A**

(a) Fill in the blanks with the correct form of the verb given within brackets :-

During the last war our country……………… 1 (be) a British Colony ………………2 (take) a full part in the war effort. Consequently our tea, rubber and coconut ………………3 (ship) to Britain at very favourable prices and the foreign exchange we ……………… 4 (earn) ………………5 (accumulate) as assets. Again during the Korean War in the early fifties our products ………………6 (fetch) good prices and we ……………. 7 (not have) any exchange problem. However, political independence ………………8 (not given rise) to any effort to………………9 (build up) our economy we ………………10 (be) a nation of consumers and we ………………11 (squander) our foreign exchange on consumer goods which ………………12 (can produce) locally and incidentally diversified our economy. Over the last decade we ……………… 13 (begin) to feel the pinch when our primary products ………………14 (fail) to command good prices in the world market while our requirements of

food both rice and subsidiary food stuffs ..............15 (rise) in price.

(b) Fill in the blanks with the correct preposition (where necessary) :

As Assistant Secretary ................. 16 charge ................. 17 subjects, it was my duty to convene groups of officers dealing .................18 different aspects of development work in the Ministry ................. 19 time to time. They discussed ................. 20 various problems that they confronted and which they could not cope .................21 on their own. We were thus able to share our experience ........... 22 each other and make concrete proposals ........... 23 the Secretary every month. He in turn put ........... 24 his own plans for discussion .................25 these meetings.

(c) Underline the correct letters given within brackets that would complete the spelling of the following words.

26. Har.................ment (rass/as/ass)
27. Ember........... (rass/as/ass)
28. Tol................. (arreance/earnce/erence)
29. Par................. arian (liament/limen/liment)
30. Bal................. ing (let/lat/lot)
31. Itin................. (erary/arary/erarie)
32. Pers................. (everance/everence/ewerence)
33. Bour................. (geoise/joursie/juwarsy)
34. Prolet................. (ariet/ariat/eriyat)
35. Com.................ate (memorr/emor/memor)

(d) In each of the following statements underline the correct word within brackets :-

36. The inventory was checked by the Board of (survellance/ survey/surveyours).

37. At the inquiry I had to be satisfied that accused officer had (contradicted/contravened/contaminated) the regulations.

38. Every receipt should have a (counterfoil/counterfeit/ counterpane) for the purpose of audit.

39. There was a possibility that the prosecution had (fabricated/ fumigated/promulgated) the evidence.

40. (Discrete/discretionary/discriminatory) power was given to the Head of the Department under the relevant Act.

41. The Police Party had (laid/lied/lain) in ambush until the bribe taker arrived.

42.The entire staff turned upon (facilitate/infiltrate/felicitate) the watcher on his retirement.

43.In times of national crisis we must avoid (luxuriant/ luxurious/habits)

44. Martial music was played over the radio during height of the battle to keep up the (moral/morale/morals) of the people.

45. Candidates are advised to use (stationary/stationery) sparingly owing to the acute paper shortage).

(e) Underline the correct phrase in the brackets that means the same as the word or phrase underlined in each sentence :

46. In good management the boss should, support his staff in their work (back out/back up/back away)

47. The sales and replacement of stocks amounted to over Rs. 5,000 (turn out/turn up/turn away)

48. We were warned at the start not to let out work get into arrears (set out/outset)

49.The younger son wasted his father's wealth in a few years (ran over/ran through)

50. I wanted to see the film, but the queue deterred me from going (put away/put off)

**Part B**

Read the following passage carefully and then answer the questions set out below :

Most modern political ideals such, for example, as justice, liberty, constitutional government, and respect for the law or at least the definitions of them, began with reflection of Greek thinkers upon the institutions of City State. But in the long history of political thought the meaning of such terms has been variously modified and always that meaning has to be understood in the light of the institutions by which the indicates were to be realized and of the society in which those institutions did their work. The Greek City States was so different from the political communities in which modern men live that it requires no small effort of the imagination to picture its social and political life. The Greek Philosophers were thinking of political practices far different from any that have prevailed commonly in modern world, and the whole climate of opinion in which the work was done was different. Their problems though not without their analogies in the preset, were never identical with modern problems, and the

ethical apparatus by which political life was evaluated and criticized varied widely from any that now prevails. In order to understand at all accurately what their theories meant is necessary first to realize at least roughly what kind of institutions they had in view and what citizenship connected, as an effect and as an ideal, to the public for whom they wrote. For this purpose the Government of Athens - is especially important, partly because it is the best known, but chiefly because it was an object of special concern to the greatest of Greek Philosophers.

As compared with modern states the ancient City-State was exceedingly small both in area and in population. The numbers were exceedingly uncertain but, a figure somewhat in excess of three hundred thousand would be approximately correct. Such an arrangement of a small territory dominated by a single City was typical off the City State.

In each of the following cases, choose the alternative which in your opinion supports the views expressed in the above passage. Place a thick (right mark) against the correct answer:-

51. Athens is significant for the students of Greek political thought mainly because :-

(a) it was the most powerful of the Greek City States;
(b) its ideals had been carefully studied by the Greek themselves;
(c) it had the most ideal form of Government;
(d) it is the best known of the Greek City- States.

52. Greek political thought was concerned with problems :-

(a) entirely unrelated to;
(b) identical with;
(c) different from Analogous but to;

53. The moral and religious basis of Greek political idea is :-

(a) very similar to modern moral and religious ideas;
(b) unknown;
(c) very different from modern moral and religious ideas.

54. It is :-

(a) easy;
(b) not at all easy;
(c) impossible,
for a modern man to imagine what life was like in a Greek City -State.

55. In comparison with the ancient Greek City States are :-

(a) very large,
(b) very small,
(c) about the same size.

56. The population of ancient Greek City States was :-

(a) much less that 300,000
(b) over 3 million,
(c) just over 300,000

57. The City State of Athens comparisons :-

(a) a small territory govern by a singly City,
(b) a large territory govern by a number of cities,
(c) a small territory with village councils,
(d) a large territory with a decentralized administration.

58. At different times in the history of the world people :

(a) have thought in basically the same way;
(b) have thought in different ways;
(c) have contradicted the views of people of the previous generation.

59. Details of political theory are derived from Greek political thought :

(a) because the Greek City States was very similar to modern states;
(b) in spite of Greek City State being very different from modern states;
(c) because modern political theorists are students of Greek Philosophy.

60. The meaning of political ideal at a particular moment in European History since the time of the Greek can be defined only be :-

(a) relating it to its context,
(b) tracing it back to its original meaning among the Greeks,
(c) investigating the meaning of the Greek word for it,
(d) taking into account only those features in it which have persisted throughout its history.

61. Write sentences using each of the following words so as to bring out its meaning clearly :

Arbitration, emoluments, etiquette, consolidates hypothetical, retrospective, exigencies, evaluate, review, empower.

EITHER

62. Write a letter to the Head of an Educational Institute in an English speaking country, setting out the following information in an orderly manner :-

(i) The equivalence of our examination certificate to the certificate specified in this letter cannot be determined as the examining authorities in Sri Lanka have not been consulted by the institution concerned in that country,

(ii) The G.C.E. (Ordinary Level) Credit Pass has been officially equated with an ordinary pass in London G.C.E. (Ordinary Level)

(iii) The receipt of the letter sent to the Commissioner General of Examinations is acknowledged,

(iv) Any further information in this matter may be obtained from the Embassy of the Republic of Sri Lanka in that country.

63. Write a memorandum to the Secretary, Bureau of Standards marking out a case for the adoption of the 24 hours clock in this country stating the advantages of such a measure.

පරිශිෂ්ටය "ආ"

01.පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

1.1 පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

1.2 මතු සඳහන් විෂයය යටතේ විභාගය පවත්වනු ලැබේ.

I වැනි කොටස

(i) මුදල් - පහත කරුණු ආවරණය වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)

(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුව
උදාඃ ඒවා සකස් කිරීම, ශීර්ෂ, මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්.

(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කර ගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත්

(ii) ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය

II වැනි කොටස- විශේෂ ප්‍රශ්න පත්‍රඃ

(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය.
(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය.
(iii) ජාත්‍යන්තර කටයුතු.
(iv) ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි සහ පරිගණක හැකියාව.

1.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

1.4 නිලධාරියෙකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත්වූවකු ලෙස සලකනු ලැබේ.

02. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2.1 දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

2.2 මතු සඳහන් විෂය යටතේ විභාගය පවත්වනු ලැබේ.

I වැනි කොටස

(i) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය,

(ii) පරිපාලනය - පහත කරුණු ආවරණය වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.

(අ) කාර්යාල ක්‍රම සහ සංවිධාන ක්‍රම,
(ආ) ආයතන සංග්‍රහය I වෙළුම සහ II වෙළුම.

II වැනි කොටස- විශේෂ ප්‍රශ්න පත්‍රඃ

(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය.
(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය.
(iii) ජාත්‍යන්තර කටයුතු.

2.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

2.4 නිලධාරියෙකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත් වූවකු ලෙස සලකනු ලැබේ.

*සටහන* :

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යටතේ ප්‍රධාන වශයෙන් ප්‍රශ්න නියම කරනු ලබන්නේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ විකාශය අළලාය.

(ii) ද්විපාර්ශ්වික මෙන්ම බහුපාර්ශ්වික දෙගණයේම අන්තර් රාජ්‍ය සම්බන්ධතා එකිනෙකට අදාළව රාජ්‍යතාන්ත්‍රික නීතිය සහ ගිවිසුම් නීතිය යන ක්ෂේත්‍රය අළලා ජාත්‍යන්තර නීතිය යටතේ ප්‍රශ්න නියම කරනු ලැබේ.

(iii) නීතිඥවරයෙකු වන්නා වූ හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීති උපාධියක් ලබා ඇත්තා වූ හෝ නිලධාරියකු විභාගයට අදාළ විෂයයවලින් සාමාර්ථයය ලබා ඇත්නම්, ඔහු/ඇය මූලික ආණ්ඩුක්‍රම නීතිය හා ජාත්‍යන්තර නීතිය යන ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කරනු ලබනවා ඇත.

03. විදේශ භාෂාඃ

3.1. විදේශ භාෂා

| | | | |
|---|---|---|---|
| (i) | අරාබි | (vi) | චීන |
| (ii) | ප්‍රංශ | (vii) | ජර්මන් |
| (iii) | රුසියානු | (viii) | ජපන් |
| (iv) | ස්පාඤ්ඤ | (ix) | ඉතාලි |
| (v) | හින්දි | (x) | කොරියානු |

3.2 ඉහත එක් එක් ලිඛිත ප්‍රශ්න පත්‍රය පැය දෙකක කාලසීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය යටතේ 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

02-854

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.